උකුවෙල ප්‍රාදේශීය සභාවේ - 2022

---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උකුවෙල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට උකුවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව ඕවිල්ල සුසානාගාරයේ වටිනාකම රු.10,000 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනයේ රු.160,000 ක් ලෙස රු.150,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | වත්කම් වටිනාකම නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළයුතුයි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කඩා ඉවත් කළ උකුවෙල පොදු වැසිකිලියේ පිරිවැය රු.1,659,435 ක් ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි. | 2023 වර්ෂයේදි අවසන් ගිණුම් සකස් කිරීමේ දි එය නිවැරදි කරන බව. | ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ උකුවෙල පොදු වෙළඳපොලේ පළමු අධියර නිමකර තිබුණ ද, එහි වටිනාකම වූ රු.6,357,503 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දි ප්‍රාග්ධනිත කිරිමට කටයුතු කරන බව | ඉදිකිරීම් ප්‍රාග්ධනිත කල යුතුය. |
| (ඈ) | දැන්වීම් පුවරු ආදායමෙන් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවියයුතු රු.26,542 ක බදු වර්ෂයේ ආදායමක් ලෙස සලකා ගිණුම් ගතකර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදි නිවැරැදි කිරිමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදි කළ යුතුය. |

**1.7** **අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 වන වගන්තිය | කුමියන්ගොඩ පිහිටි එම ව්‍යාපාරික ස්ථානයේ පරීක්ෂා කරන 2023 පෙබරවාරි 07 දිනට ආපන ශාලාවක් පවත්වාගෙන යමින් පැවැති අතර, ඒ වන විට අදාල ගොඩනැගිලි සඳහා අනුකූලතා සහතික ලබාගෙන නොතිබුණි. ඒ අනුව වෙළඳ බලපත්‍රය අයදුම්කළ 2021 අගෝස්තු 01 දින සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට දින 516 ක් සඳහා රු.25,800 ක ගාස්තු අයකර නොතිබුණි. | මෙම ගොඩනැගිල්ලට අදාලව නෛතික කටයුතු පවතින බැවින් අනුකූලතා සහතිකයක් නිකුත් කිරීමට නොහැකි වූ බව. | පනතේ විධිවිධාන අනුව ගණනය කර හිඟ ශේෂ අයකර ගත යුතුය. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | රීති 59 | බලපත්‍ර සමීක්ෂණය පදනම් කරගෙන කර්මාන්ත පිළිබද ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | බලපත්‍ර සමීක්ෂණය මේවන විට සිදුකර ලැයිස්තු පිළියෙල කර ඇති බව. | රීති ප්‍රකාරව කටයුතු කළයුතුය |
| (ii) | රීති 61 | පී.එස්. 26 ඒ ආකෘතිය ප්‍රකාරව කර්මාන්ත බදු ලේඛන සකස් කර නොතිබීම හේතුවෙන් රීති 65 ප්‍රකාරව ගෙවීම් පැහැර හරින්නන් හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි. | මේ වන විට අදාල ලේඛණ සකස් කර ඇති බව. | රීති ප්‍රකාරව ලේඛන සකස් කළ යුතුය |
| (iii) | රීති 218 | 2017 දෙසැම්බර් 31 දිනෙන් පසුව ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේ දී සමීක්ෂණයක් කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මු රෙ 1646 | සභාවට අයත් වාහන 16 ක දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී රෙගුලාසිය අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | රු. 12,596,982 ක ලී බඩු හා සවිකිරීම්, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2023 වර්ෂයේ සිට යාවත්කාලීව පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | | | |
| (i) | 10 ඡේදය | උකුවෙල පොදු වෙළඳසැලේ කඩ කාමර 06 ක බදුකරුවන් මාසික කුලී රු.6,000 සිට රු.15,000 දක්වා මුදලකට වෙනත් පාර්ශවයන්ට අතුරු බදු දී තිබුණි. | වෙළඳ බලපත්‍ර ලබා ගෙන ඇත්තේ සභාව සමඟ ගිවිසුම් ගත කඩ කාමර හිමියන් විසින් බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 5(1) ඡේදය | කඩ කාමර 59 ක් සඳහා 2011 වර්ෂයේ සිට එකම ගාස්තුවක් දිගින් දිගටම අයකරමින් පැවතුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය නිසා වාර්තා ඉදිරිපත් නොවූ බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (iii) | 06 ඡේදය | 2020 වර්ෂයේ ලබාගත් නව තක්සේරුවට අනුව උකුවෙල පොදු වෙළඳපොළ කඩ කාමර 45 ක ගිවිසුම් අළුත් කර නොතිබුණු අතර, ඉන් කඩ කාමර 13 ක් 2000 වර්ෂයෙන් පසු වසර 22 ක කාලයක සිට ගිවිසුම් අළුත් කිරීමක් සිදුකර නොතිබුණි. | සංශෝධනය කරන ලද තක්සේරුව ලද පසු ගිවිසුම් අළුත්කිරීමට කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,311,456 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 34,019,555 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,101,000 | 2,111,813 | 2,425,177 | 449,710 | 2,181,000 | 3,039,768 | 2,830,709 | 763,074 |
| (ii) | කඩ කුලී | 4,000,000 | 1,239,710 | 1,416,971 | 446,717 | 5,480,000 | 5,268,254 | 4,762,908 | 623,978 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,110,000 | 546,330 | 546,330 | - | 2,030,000 | 1,496,402 | 1,496,402 | - |
| (iv) | වෙනත් ආදායම් ජල | 5,000,000 | 3,749,009 | 4,437,448 | 1,579,564 | 39,040,269 | 47,036,581 | 48,899,248 | 39,194,681 |
| | එකතුව | 12,211,000 | 7,646,862 | 8,825,926 | 2,475,991 | 46,550,269 | 56,841,005 | 57,989,267 | 40,581,733 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් | | |
| එක් ඒකකයකින් රු.1,000 කට වඩා වැඩි, හිඟ හිටි දේපල 138 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු.378,249 ක් විය. | ඉදිරියේ දී ජංගම සේවා පවත්වා දේපල තහනම් කිරීම් වලින් ඉතිරි මුදල අයකර ගැනිමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව ගණනය කර හිඟ ශේෂ අයකර ගත යුතුය. |
| (ආ) කඩ කුලී | | |
| පොදු වෙළඳපල ගොඩනැඟිල්ලේ කඩකාමර 8 ක් 2021 දෙසැම්බර් 21 දින හා තවත් කඩ කාමර 8 ක් 2022 ජුලි 14 දින ඉදිකිරීම් නිමකර බාරදී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට | 2019 වර්ෂයේ රට තුල පැවැති තත්ත්වය මත විදුලි බල මණ්ඩලයෙන් සැපයීම් ලබා ගැනීමේ | ඉදිකර අවසන් කඩ කාමර බදු දීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| විදුලිය ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් කඩ කාමර බදුදීමට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් එම කාලපරිච්ඡේදය සඳහා ලබා ගැනීමට හැකිව තිබුණු රු.432,000 ක බදු කුලී අහිමි වී තිබුණි . | ප්‍රමාදවීම සිදු වූ බව. | |

(ඇ) ත්‍රීරෝද රථ ගාස්තු

| | | |
|---|---|---|
| සභාබල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ හිමියන් 149 ක් පමණක් අදාල ගාස්තු සභාවට ගෙවා තිබූ අතර ඉතිරි ත්‍රීරෝද රථ 67 කින් රු.40,200 ක ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ එම හිඟ ගාස්තු අයකිරිමට කටයුතු කර ඇති බව. | ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 4 ක එකතුව රු.11,298,759 ක් විය. | හිඟ ආදායම් එකතු කර ගැනිම සඳහා කණ්ඩායම් වශයෙන් නිලධාරින් යොදවා ජංගම සේවාවන් පැවැත්වීමට කටයුතු සකසා ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.21,805,816ක් විය. | 2023 වර්ෂයේ එම හිඟ ගාස්තු අයකිරිමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරිමට කටයුතු කල යුතුය. |
| (ඇ) | උකුවෙල ප්‍රාදේශීය සභාව විසින් සුසාන භූමි ලෙස භාවිතා කරන ඉඩම් කොටස් 46 ක (දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය සතු සුසාන භූමි 03 ක් ද ඇතුලත්ව) අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා දීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශිය ලේකම් සහ ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය වෙත ඉල්ලීම් කර ඇති බව. | ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදී තනතුරු 10 ක පුරප්පාඩු 17ක් ද එක් තනතුරකට අදාළව අතිරික්ත 09 ක් ද පැවතුණි. | ප්‍රාථමික සේවා සනයේ පුරප්පාඩු තනතුරු සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයන් බඳවා ගැනිමට තීරණය කර ඇති බැවින් සියළුම බඳවා ගැනිම් තාවකාලිකව අත්හිටුවා ඇති බව. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක ගොඩනැඟිලි සංවර්ධන බලපත්‍ර සඳහා අයදුම්පත් 2,219 ක් ලැබී තිබුණු අතර, ඉන් අයදුම්පත් 1,992 ක් අනුමත කර තිබුණි. එම කාලය තුළ අනුකූලතා සහතික 64 ක් පමණක් නිකුත් කර තිබුණි. එසේම අනුමත නොකළ අයදුම්පත් 227 ක් සම්බන්ධව පසුවිපරම් කිරීමක් ද සිදුකර නොතිබුණි. | අනුකූලතා ලබාගැනිමට ලිඛිත ව හා වාචිකව දැනුවත් කල ද අනුකූලතා ලබා ගැනිම ප්‍රමාද කර ඇති බව | අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී වැය විෂයයන් 20 ක සියයට 41 සිට සියයට 100 දක්වා ද ආදායම් විෂයයන් 34 ක සියයට 51 සිට සියයට සියය ඉක්මවූ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලක කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි | ඉදිරියේ අයවැය ලේඛන සකස් කිරීමේදී චක්‍රලේඛ උපදෙස් වලට අනුව කටයුතු කරන බව. | අවශ්‍යතාවය සොයා බලා නිසි අවධානයෙන් අයවැය පිළියෙල කළ යුතුය. |